# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 473/9 — 1987 සැප්තැම්බර් 30 බදාදා — 1987.09.30

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡේදය — සාමාන්‍ය

## විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

### 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත

1985 අංක 7 දරන පනතින් සංශෝධිත 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 18 වන වගන්තිය සමග කියවිය යුතු 48අ වගන්තිය යටතේ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සාදනු ලැබූ නියමාවලිය.

එම්. ඩී. ජී. අබේරත්න,
ලේකම්,
විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

1987 ඔක්තෝබර් මස 01 වන දින,
කොළඹ දීය.

### නියමාවලිය

1. මේ නියමාවලිය, 1987 අංක 03 දරන පශ්චාත් උපාධි අධ්‍යයන පීඨ නියමාවලිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, එය 1987 ඔක්තෝබර් මස 1 වන දින සිට ක්‍රියාත්මක විය යුතු ය. තව ද එය පනතේ 48අ(1) වන වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ සියලුම පශ්චාත් උපාධි අධ්‍යයන පීඨවලට අදාළ විය යුතු ය.

2. පනතේ සහ යම් උචිත ආඥා පත්‍රයක විධිවිධානවලට යටත්ව, පනතේ 48අ(1) වන වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ (මෙහි මින්මතු 'පීඨය' යනුවෙන් සඳහන් කරනු ලබන) පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයක්, ඒ ඒ විශ්ව විද්‍යාලය සහ කොමිෂන් සභාව එකඟ වන්නා වූ යම් අධ්‍යයන ක්ෂේත්‍රයක හෝ ක්ෂේත්‍රවල, පර්යේෂණ, ප්‍රවර්ධනය කිරීම සහ උසස් උපාධි ලබාගත හැකි අධ්‍යයන පාඨමාලා හා වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා හැලසීමේ කාර්යය උදෙසා වූ පරිපාලනමය මධ්‍යස්ථානය විය යුතු ය.

3. විශ්ව විද්‍යාලය තුළ කරගෙන යනු ලබන පශ්චාත් උපාධි අධ්‍යයන සහ විශේෂ හෝ බහු විෂයාන්තර පර්යේෂණ සම්බන්ධයෙන් අනුග්‍රහය දැක්වීම, ඒවා සම්බන්ධීකරණය කිරීම සහ විධිමත් කිරීම පීඨයක් විසින් කරනු ලැබිය යුතු අතර අදාළ විශ්ව විද්‍යාලයේ සනාතන සභාවේ විධානයට හා පාලනයට යටත්ව පහත දැක්වෙන කාර්ය සඳහා ද බලය ඊට ඇත්තේ ය:—

(අ) විශ්ව විද්‍යාලවලට අනුබද්ධිත පශ්චාත් උපාධි ආයතනවලට ඇතුළත් කරගනු ලබන ශිෂ්‍යයන් හැර, අනෙකුත් ශිෂ්‍යයන් පශ්චාත් උපාධි අධ්‍යයනය සඳහා ඇතුළත් කර ගැනීම;

(ආ) ඇතුල්වීමේ සුදුසුකම්, පාඨමාලාව සඳහා සුදුසුකම්, පාඨමාලාවල විෂය පථය සහ විභාග පටිපාටිය නියම කිරීම;

(ඇ) විශ්ව විද්‍යාලයේ ඉගැන්වීම සහ පර්යේෂණ කටයුතු විධිමත් කිරීම;

(ඈ) විභාග පරීක්ෂකවරයන් වශයෙන් පත් කිරීම සඳහා නැනැත්තන් නිර්දේශ කිරීම;

(ඉ) උසස් උපාධි සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා ප්‍රදානය කිරීම සඳහා ශිෂ්‍යයන් නිර්දේශ කිරීම;

(ඊ) පශ්චාත් උපාධි ඉගැන්වීම් හා පර්යේෂණ කටයුතුවල දී අන්තර්-ඒ ඒ පීඨ අතර සහ යම් පීඨයක් තුළ සහයෝගිතාව වැඩි දියුණු කිරීම;

(උ) පර්යේෂණ කටයුතු භාර ගැනීමෙහිලා විද්වතුන් ධෛර්යමත් කිරීම සහ එවැනි පර්යේෂණ කටයුතු හා දැනුම ප්‍රචලිත කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් සැපයීම; සහ

(ඌ) ශ්‍රී ලංකාවේ සහ ඉන් පිටත පිහිටි වෙනත් පශ්චාත් උපාධි පීඨ සහ පාඨශාලා, පර්යේෂණ ආයතන සහ විශ්ව විද්‍යාල සමග සම්බන්ධතා ඇතිකර ගැනීම සහ ඒ සම්බන්ධතා පවත්වා ගෙන යාම.


I A—A 099727—1,080 (87/09)